*සැ. යු.-* 2013.07.26 දින පළ වූ අංක 1,821 දරන ගැසට් පත්‍රයේ I ( III) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,822 - 2013 අගෝස්තු මස 02 වැනි සිකුරාදා - 2013.08.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1726 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1730 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.-* (i) පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 ජුනි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී ;

(ii) අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 ජූලි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී ;

(iii) මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 ජූලි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ගම්පහ මහ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගිනිභට තනතුරු සඳහා බඳවා ගැනීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගම්පහ මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති පුද්ගලයින්ගෙන් (පිරිමි) අයදුම්පත් කැඳවනු ලැබේ.

*01. වැටුප් ක්‍රමය* :- රු. 14,280-145 x 7-180 x 10-240 x 17- රු.21,175 (RS-1-2006A)

*02. වයස් සීමාව* :- වයස අවුරුදු 19ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25ට නොවැඩි විය යුතු ය.

ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පවත්වනු ලබන ගිනිභට පාඨමාලාව හදාරා ඇති අයදුම්කරුවන්ගෙන් වයස් සීමාව ප්‍රථම වතාවට පමණක් අවුරුදු 35 දක්වා දීර්ඝ කරනු ලැබේ.

*03. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* :-

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල, දෙමළ, ගණිතය, විද්‍යාව, ඇතුළු විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර, ඉන් විෂයයන් 05ක් එක් වරක දී සමත්ව තිබිය යුතු ය.

*(ආ)* විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර ඔවුන්,

(i) අඩි 5 අඟල් 4ක අවම උසකින් යුක්ත විය යුතු ය;
(ii) රාත්තල් 125 (55.5Kg) ක අවම බරකින් යුක්ත විය යුතු ය ;
(iii) අයදුම්රුවන් අවිවාහක විය යුතු ය ;
(iv) බස්නාහිර පළාත තුල අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.

4. *බඳවා ගැනීමේ ක්‍රමය* :

රා.ප.ච. 15/90 පරිදි ලිඛිත පරීක්ෂණයකට හා යෝග්‍යතා පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කෙරේ.

බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ගම්පහ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසිනි.

බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය :-

*(අ)* සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.

*(ආ)* ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අවස්ථාවෝචිතව යෝග්‍ය පරීක්ෂණයක් සිදු කෙරේ.

5. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය;
(ii) ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසිවලටද අදාළ පළාත් පාලන ආයතනයේ ආයතන ප්‍රධානියාගේ නියෝගවලටද අනුකුලව ක්‍රියා කළ යුතු ය. මෙම තනතුරේ සේවය බස්නාහිර පළාත තුළට සීමාවේ.

6. *සේවා කොන්දේසි* :

තෝරාගන ලබන අයදුම්කරුවන් පළමුව ගිනි නිවීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතුය.

එම පුහුණු කාල සීමාව තුළදී රු. 3,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

පුහුණු කාල සීමාව තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ලඟාවිය නොහැකි වන පුහුණුකරුවන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කිරීම පත්වීම් බලධාරියාට කළ හැකිය.

පුහුණුව සඳහා ඇතුළත් වන අවස්ථාවේ දී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05ක කාලසීමාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු. 10,000ක වටිනාකමින් යුතු බැඳුම්කරයන් අත්සන් කළ යුතු ය.

පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම අභ්‍යාසලාභීන් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

ගිනිභටයන් වශයෙන් පත්වීම් ලැබූවිට එම පත්වීම්ලාභීන් අදාල පළාත් පාලන බල ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්ය වේ.

7. කාර්යක්ෂමතා කඩඉම :-

ගම්පහ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් නම් කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් සමත්වීමෙන් අනතුරුව පත්වීම් බලධාරියා විසින් කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස්කරනු ලැබේ.

*ලිඛිත පරීක්ෂණය :* ගිනි නිවීම් විද්‍යාව පිළිබඳ - පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි.

තනතුරට ඉල්ලුම්කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර මගින් 2013.08.12 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "නාගරික කොමසාරිස් මහ නගර සභාව ගම්පහ" යන ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත්‍රය බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ගිනිභට තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු වේ. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල සහතික කරන ලද පිටපතක් එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික සහ වෙනත් අදාළ සහතික;
(iii) මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;

කේ. එම්. ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර,
නාගරික කොමසාරිස්,
ගම්පහ මහ නගර සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගිනි නිවීම් සේවයේ ගිනිභට තනතුරු සඳහා බඳවා ගැනීම** -2013

1. මුලකුරු සමඟ නම :—————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
2. ස්ථිර ලිපිනය :—————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
4. ස්ත්‍රී /පුරුෂ භාවය :—————.
5. උපන් දිනය :—————.
   අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.
6. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද ? :—————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
8. අධ්‍යාපන සුදුසුකම් :—————.
   (i) අ.පො.ස. (සා.පෙළ ) විභාගය :
   පළමුවර සමත් වර්ෂය:.......................... විභාග අංක:......................... දෙවන වර සමත් වර්ෂය.:....................... විභාග අංක:.........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

   (ii) වෙනත් සුදුසුකම් :
9. වෘත්තීය සුදුසුකම් :—————.
10. සේවා පළපුරුද්ද :
   (i) දැනට සේවය කරන ආයතනය:—————.
   (ii) දැනට දරන තනතුර:—————.
   (iii) එම තනතුරට පත්වූ දිනය :—————.
   (iv) පෙර සේවය කරන ලද ස්ථානයේ දරන ලද තනතුර :—————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසු ඒ බව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

08-51

## මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසිකව) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 11,730-10x120 - 10 x 130- 10 x 145-12 x 160 -රු.17,600 (PL 1-2006A) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 04 | රු. 11,730-10x120 - 10 x 130- 10 x 145-12 x 160 -රු.17,600 (PL 1-2006A) | 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත් වී තිබිය යුතුය. |
| 03 | රියැදුරු | 02 | රු. 12,470-10x130 - 10 x 145- 10 x 160-12 x 170 -රු.18,860 (PL 3-2006A) | 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතුය. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතා සහතිකය හා වාහන රියදුරකු වශයෙන් වසර 3ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කල යුතුය. අවම උස අඩි 05ක් විය යුතුය. මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |
| 04 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රු. 12,210-10x130 - 10 x 145- 10 x 160-12 x 170 -රු.18,600 (PL 2-2006A) | අ.පො.ස. (සා.පෙළ) ජා.පො.අ.ස. විභාගයෙන් කුමන හෝ විෂයයන් 02ක් සමත්වීම සහ අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (රජයේ ලියාපදිංචි ආයතනයක) |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය . (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බලනොපානු ඇත.)

(iv) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.

(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2013.08.30වැනි දිනට පෙර ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය

සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුයි.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
(iv) මෑතකදී ලබාගත් ග්‍රාමසේවා සහතිකය;
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
(vi) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vii) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම්,
මහර ප්‍රාදේශීය සභාව.

2013ක් වූ ජූලි මස 15 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළකරගහමුණ,
කඩවත.

ආදර්ශ අයදුම්පත්‍රය

**මහර ප්‍රාදේශීය සභාව**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමග නම :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
3. ස්ථිර ලිපිනය :——————————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
5. උපන් දිනය ෑ 2013.08.30 දිනට වයස ෑ අවුරුදු :——————————.මාස:——————————. දින:——————————.
6. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ උපතින්ද /ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————.
8. (i) අධ්‍යාපන සුදුසුකම්:——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

   (ii) වෙනත් සුදුසුකම්:——————————.
9. වෘත්තීමය සුදුසුකම්:——————————.
10. සේවා පළපුරුද්ද ෑ
   (i) දැනට දරන තනතුර :——————————.
   (ii) එම තනතුරට පත් වූ දිනය:——————————.
   (iii) එම තනතුරේ සේවා කාලය:——————————.
   (iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය:——————————.

*දැනටමත් සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන............................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ .......................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

————————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————————————.

08-98

---

# පළාත් පාලන නිවේදන

## ඇල්ල ප්‍රාදේශීය සභාව

### මදුරුවන් සහ රෝගී කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීම

ඇල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 ජූනි මස 27 වැනි දින පවත්වන ලද ඇල්ල තීරණ අංක 03 :03 යටතේ පහත දැක්වෙන යෝජනාව සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. සුනිල් ගාමිණී,
සභාපති,
ප්‍රාදේශීය සභාව - ඇල්ල.

2013 ජූලි මස 01 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය සභාව.

**යෝජනාවයි**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ, ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1678-4 හා 2010.11.02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා".

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වන වගන්තිය 9 වැනි උපවගන්තිය ලැබී ඇති බලතල ප්‍රකාරව ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිළිගැනීමටත්, ක්‍රියාත්මක කිරීමටත්, බල පැවැත්විය යුතු අතුරු ව්‍යවස්ථාව වශයෙන් මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළකරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට, ඉහත කී පළාත් පාලන ආයතන (අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඇල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

මෙම සම්මත අතුරු ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමේ දී සම්මත අතුරු ව්‍යවස්ථාවේ යෙදෙන සභාව, සභාපතිවරයා, ලේකම්වරයා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන යෙදුම්වලින් ඇල්ල ප්‍රාදේශීය සභාව, ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් සහ ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වන්නේ ය.

08-116/1

---

## ඇල්ල ප්‍රාදේශීය සභාව

### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම

ඇල්ල ප්‍රාදේශීය සභාව විසින් 2013 ජූනි මස 27 වැනි දින පවත්වන ලද තීරණ අංක 02 හා 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. සුනිල් ගාමිණී,
සභාපති,
ප්‍රාදේශීය සභාව - ඇල්ල.

2013 ජූලි මස 01 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2012.10.05 වන දින අංක 1778-45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වැනි වගන්තියේ 9වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිළිගැනීමටත්, ක්‍රියාත්මක කිරීමටත් බල පැවැත්විය යුතු අතුරු ව්‍යවස්ථාව වශයෙන් මෙම යෝජනාව *ගැසට්* පත්‍රයේ පළකරන දින සිට ක්‍රියාත්මක කිරීමටත් පිළිගැනීමටත් ඉහත කී පළාත් පාලන ආයතන (*අතුරු ව්‍යවස්ථා*) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඇල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

මෙම සම්මත අතුරු ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමේදී සම්මත අතුරු ව්‍යවස්ථාවේ යෙදෙන සභාව, සභාපතිවරයා, ලේකම්වරයා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන යෙදුම් වලින් ඇල්ල ප්‍රාදේශීය සභාව, ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති, ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් සහ ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වන්නේය.

08-116/2

---

## ගලිගමුව ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ පළමුවන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, ගලිගමුව ප්‍රාදේශීය සභාව විසින් 2012.12.28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 05-1 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. පී. කැලුම් නිශාන්ත පතිරන,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 19 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (2) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සාදනු ලැබූ 2011.01.28 දිනැති අංක 1691 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV(ආ) වන කොටසේ පල කරන ලද, සබරගමුව පළාත් සභාව මගින් ස්ථිර කරනු ලැබූ බව 2012.03.30 දිනැති අංක 1752 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV(අ) වන කොටසේ පළකරන ලද්දාවූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා වල මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව, මේ යෝජනාව *ගැසට්* පත්‍රයේ පළ කරන ලද දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වන වගන්තියේ 01 වන උප වගන්තිය යටතේ ගලිගමුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

08-46

---

**1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5(1) යටතේ කරනු ලබන දැන්වීම**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ 11 වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ 11 වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තියෙන් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂයභාර අමාත්‍ය වන අතුල සරත් කුමාර විජේසිංහ වන ම විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් සුසාන මළමිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

නීතිඥ අතුල සරත් කුමාර විජේසිංහ,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
වයඹ පළාත් සභාව.

2013 මැයි මස 23 වැනි දින,
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.

### වාරියපොල ප්‍රාදේශීය සභාව

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර වැව උඩ මිනීපිටිය සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇඹව ගමෙහි අ:ග:පි: 2522 පත්‍ර අංක 18/53 හි වැව උඩමිනීපිටිය නැමති ඉඩමේ කැබලි අංක 05.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | වාරියපොල |
| ග්‍රාම නිලධාරි වසම | - | 1241 ඇඹව |
| ගම | - | ඇඹව |
| ඉඩමේ නම | - | වැවඋඩ මිනීපිටිය |

*මායිම් :-*

| | | |
|---|---|---|
| *උතුරට* | - | කැබලි අංක 4 |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 6 හා 7 |
| *දකුණට* | - | අ.ග.පි. 2523 දළුපොත ගම්මායිම |
| *බටහිරට* | - | අ.ග.පි. 2523 දළුපොත ගම්මායිමට මායිම් වූ හෙක්. 0.339 (අක්කර 0, රූඩ් 3, පර්චස් 14) ක් වූ සුසාන භූමිය |

### වාරියපොල ප්‍රාදේශීය සභාව

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර හිරිගොල්ල කැරකෝප්පුව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නෑටිය ගමෙහි අ:ග:පි: 89 පත්‍ර අංක 18/31 හි හිරිගොල්ල කැරකෝප්පුව නැමති ඉඩමේ කැබලි අංක 109

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | වාරියපොල |
| ග්‍රාම නිලධාරි වසම | - | 1251 නෑටිය |
| ගම | - | නෑටිය |
| ඉඩමේ නම | - | හිරිගොල්ල කැරකෝප්පුව |

*මායිම් :-*

| | | |
|---|---|---|
| *උතුරට* | - | කැබලි අංක 108,104 සහ 107 |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 107,111 සහ අ.ග.පි. 2502 බලලුවාගාරය ගම්මායිම |
| *දකුණට* | - | කැබලි අංක 110 සහ වැඋඩවිල්ලි හත්පත්තුවෙහි මායිම |
| *බටහිරට* | - | වැඋඩවිල්ලි හත්පත්තුවෙහි මායිමට මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්. 0.602 (අක්කර 1, රූඩ් 1, පර්චස් 38ක් විශාල වූ සුසාන භූමිය) |

### වාරියපොල ප්‍රාදේශීය සභාව

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර මිනුවන්ගැටේ මිනීපිටිය ප්‍රකාශයට පත් කිරීම

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මිනුවන්ගැටේ ගමෙහි අ:ග:පි: 2488 පත්‍ර අංක 18/54 හි මිනුවන්ගැටේ මිනීපිටිය නැමති ඉඩමේ කැබලි අංක 97

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | වාරියපොල |
| ග්‍රාම නිලධාරි වසම | - | 1253 මිනුවන්ගැටේ |
| ගම | - | මිනුවන්ගැටේ |
| ඉඩමේ නම | - | මිනුවන්ගැටේ මිනීපිටිය |

මායිම් :-

| | | |
|---|---|---|
| *උතුරට* | - | කැබලි අංක 74 සහ 218 |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 74 හා අ.ග.පි. 2491 කෝරලේගම ගම්මායිම |
| *දකුණට* | - | කැබලි අංක 218 සහ අ.ග.පි. 2491 කෝරලේගම ගම්මායිම |
| *බටහිරට* | - | කැබලි අංක 218 මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.435 (අක්කර 1, රූඩ් 0, පර්චස් 12) ක් වූ සුසාන භූමිය |

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර, (ගිනිපෙන්දේගම මිනීපිටිය සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගිනිපෙන්දේගම ගමෙහි අ.ග.පි. 2681 පත්‍ර අංක 18/44 හි ගිනිපෙන්දේගම මිනීපිටිය නැමති ඉඩමේ කැබලි අංක 102

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | වාරියපොල |
| ග්‍රාම නිලධාරී වසම | - | 1246 ගිනිපෙන්දේගම |
| ගම | - | ගිනිපෙන්දේගම |
| ඉඩමේ නම | - | ගිනිපෙන්දේගම මිනීපිටිය |

*මායිම්* :-

| | | |
|---|---|---|
| *උතුරට* | - | අ.ග.පි. 2677 කලවානේගම මායිම |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 81 සහ 03 |
| *දකුණට* | - | කැබලි අංක 70 |
| *බටහිරට* | - | කැබලි අංක 70 සහ අ.ග.පි. 2677 කලවානේගම ගම්මායිමට මායිම් වූ හෙක්. 0.137 (අක්කර 01, රූඩ් 01, පර්චස් 14) ක් වූ භූමිය |

08-47

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතුය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමලේඛනය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිලදී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| අගෝස්තු | 2013.08.02 | සිකුරාදා | 2013.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.08 | බ්‍රහස්පතින්දා | 2013.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.16 | සිකුරාදා | 2013.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.23 | සිකුරාදා | 2013.08.08 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.08.30 | සිකුරාදා | 2013.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2013.09.06 | සිකුරාදා | 2013.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.13 | සිකුරාදා | 2013.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.20 | සිකුරාදා | 2013.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.27 | සිකුරාදා | 2013.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2013.10.04 | සිකුරාදා | 2013.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.11 | සිකුරාදා | 2013.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.17 | බ්‍රහස්පතින්දා | 2013.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.25 | සිකුරාදා | 2013.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.